මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# Human Rights Commission of Sri Lanka

ලේකම්,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය
2 වන මහල, කම්කරු මහලේකම් කාර්යාලය,
කොළඹ 05.

**පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණයේදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම**

ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ විධි විධාන නිසි ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියළු දේ කිරීමට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බලතල අප කොමිෂන් සභාවට හිමිව ඇත.

2014 දෙසැම්බර් මස 22 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, කම්කරු අමාත්‍යාංශයේ ලේකම්, කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සහ මැතිවරණ කොමසාරිස්වරයාගේ සහභාගීත්වයෙන් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. උක්ත සාකච්ඡාව පදනම්ව 2015 ජනවාරි මස 08 වෙනිදාට යෙදී තිබූ ජනාධිපතිවරණයේ දී පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ඡන්දය භාවිතා කිරීම සඳහා 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ පනත ප්‍රකාරව මැතිවරණ කොමසාරිස්වරයා විසින් පෞද්ගලික අංශය සඳහා ලබාදිය යුතු නිවාඩු කාලසීමාවන් දක්වන ලිපියක් 2014.12.23 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එය පදනම් කර 2015 ජනවාරි 08 දින පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්හට නිවාඩු ලබාදිම පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනයක් ඔබ දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් වල පළකරන ලදී.

ඒ අනුව උක්ත මැතිවරණයේ දී සිය සර්වජන ඡන්දය පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට බාධාවකින් තොරව ලබාගැනීමට අවස්ථාව උදාවිය. මෙවර පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ද "**කිසිවෙකු අත්නොහැරෙන පාර්ලිමේන්තු මහ මැතිවරණයක් තහවුරු කරමු**" යන තේමාව ඔස්සේ පුරවැසියන්ගේ පරමාධිපත්‍ය ඡන්දය ප්‍රකාශකිරීම තුළින් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරගෙන යනු ලැබේ. පුරවැසියන්ගේ පරමාධිපත්‍ය තහවුරු කරගැනීම සඳහා පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයින්ට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම සඳහා ප්‍රසිද්ධ පුවත්පත් නිවේදනයක් පල කිරීම වැනි මැදිහත්වීම් සුදුසු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කරනු ලබයි. ඒ අනුව ඔබ අමාත්‍යාංශය මේ සඳහා කඩිනම් සුදුසු මැදිහත්වීමක් සිදුකරනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලැබේ.

ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

2014 දෙසැම්බර් මස 22 දින සාකච්ඡාව පදනම් කර පෞද්ගලික අංශයේ සේවකයින්හට ජාතික මැතිවරණ වලදී වැටුප් සහිතව පෞද්ගලික නිවාඩු අහිමිවීමකින් තොරව ස්වකීය ඡන්දය දීමට හැකිවන පරිදි නිවාඩු ලබාදීම සම්බන්ධ ක්‍රමවේදය ඇතුළත් මැතිවරණ කොමසාරිස්තුමාගේ 2014.12.23 දිනැති ලිපියේ පිටපතක් සහ මේ සම්බන්ධයෙන් කම්කරු අමාත්‍යාංශය විසින් සිංහල/දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කල පුවත්පත් දැන්වීම් පිටපත් ද ඔබගේ කාරුණික අවධානය සඳහා මේ සමඟ යොමු කරමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2020 ජූලි මස 13

පිටපත : සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව.